පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
POVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE
372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ பணிப்பாளர் Director | 025 - 2234673 | කාර්යාලය அலுவலகம் Office | 025 - 2224173 | ෆැක්ස් பெக்ஸ Fax | 025 - 2224173 |
| මගේ අංකය எனது இலக்கம் My No. | NCP/SS/E1/20 | ඔබේ අංකය உமது இலக்கம் Your No. | | දිනය திகதி Date | 2015/10/02 |


පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 05/2015

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සංවර්ධන සහකාර නිලධාරීන්/ සංවර්ධන නිලධාරී වෙත,

ස්වයං රැකියා ආධාර මුදල් ගෙවීම

ජීවිකා වෘත්තියක් දියුණු කිරීම තුළින් විවිධ රෝගාබාධ, වයෝවෘද්ධභාවය, වැන්දඹු, ගෘහමූලිකයා සිරගතවීම හෝ අන්ත දිළිඳු බව හේතුවෙන් අසරණව සිටින පුද්ගලයන්ගේ හා පවුල් ඒකකයන් වෙත මාසිකව ලබා ගන්නා මහජනාධාර මුදලට වඩා වැඩි ආදායමක් මාසිකව සපයා ගැනිමට දිරි ගැන්වීම හා එතුලින් ස්වයං ජීවිකා වෘත්තියක් ගොඩනගා ගැනීම තුළ ජාතික ආදායමේ කොටස්කරුවන් වීමේ ස්වයං අභිමානයෙන් යුක්තව ජීවත් විමට පහසුකම් සැලසීම උදෙසා මෙම දෙපාර්තමේන්තු ස්වයං රැකියා ආධාර වැඩසටහන යටතේ ගෙවනු ලබන රු. 10,000.00 ක ස්වයං රැකියා ආධාර මුදල රු. 20,000.00ක් දක්වා වැඩි කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව පළමු වාරිකය රු. 10,000.00ක් ලෙස හා එම මුදල් වැය කළ ආකාරයේ ප්‍රගතිය මත දෙවන වාරිකය රු. 10,000.00ක් ලෙස මෙම ආධාර මුදල වාරික දෙකකින් ගෙවනු ලැබේ.

03. මෙම ස්වයං රැකියා ආධාර මුදල් ගෙවීම සම්බන්ධයෙන් වන විධිවිධාන හා මග පෙන්වීම් පහත පරිද්දෙනි.

1. ස්වයං රැකියා ආධාර ලැබීමට සුදුස්සන්
   - දැනට මහජනාධාර දීමනා ලබන , තම දරුවන් රැක බලාගත යුතු නිසා කිසියම් වැඩක නිරත විය නොහැකි, පාසල් යන වයසේ දරුවන් සිටින ක්‍රියාශීලිව කිසියම් වැඩක නිරත විය හැකි වැන්දඹු හෝ ස්වාමියා සිරගත වූ කාන්තාවක් වීම හෝ
   - දැනට මහජනාධාර දීමනා ලබන නමුත් පවුලක් රැක ගැනිම සඳහා කිසියම් වැඩක නිරත විය හැකි ක්‍රියාශීලි අයෙකු වීම හෝ
   - නිශ්චිතවම තමාට ආදායමක් ලබා ගැනීමට හැකි යැයි සිතෙන , තම හැකියාව හා අවට සම්පත් උපයෝගි කරගෙන කල හැකි සුළු ව්‍යාපාරික කාර්යයක් පිළිබඳ අදහසක් ඇති මහජනාධාර දීමනා ලබන අයෙකුවීම හෝ
   - නිශ්චිතවම තමාට ආදායමක් ලබා ගැනීමට හැකි යැයි සිතෙන , තම හැකියාව හා අවට සම්පත් උපයෝගි කරගෙන කල හැකි සුළු ව්‍යාපාරික කාර්යයක් පිළිබඳ අදහසක් ඇති මහජනාධාර දීමනා ලබන විවධ රෝගාබාධයන්ට ලක්වීම හේතුවෙන් අසරණ වූ අයෙකු

2. ස්වයං රැකියා ආධාර ගෙවීමේ සීමාවන්
   - අදාල ආදායම් උත්පාදන ස්වයං රැකියා ව්‍යාපෘති වාර්තාව අනුව රු. 20,000ක උපරිමයකට යටත්ව මෙම ආධාර ලබා දෙනු ලැබේ.

3. ස්වයං රැකියා ආධාර ගෙවීමේ ක්‍රියා පටිපාටිය
   - ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම, ග්‍රාම නිලධාරී නිර්දේශය, සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරී/ සංවර්ධන නිලධාරී (සමාජ සේවා) අදාල පුද්ගලයා හමුවී පවුලේ තොරතුරු හා ඉල්ලීමේ දක්වන ලද කරුණු ද ස්වයං රැකියා යෝජනාව සම්බන්ධව ද පරීක්ෂා කර සකස් කරනු ලබන ව්‍යාපෘති යෝජනාව හා අයදුම්පත තම නිර්දේශය, ප්‍රාදේශීය ලේකම් නිර්දේශය සමගින් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
   - ඒ අනුව අනුමත වන ස්වයං රැකියා ආධාර ඉල්ලීම් සඳහා මුදල් ගෙවීම පිණිස අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් මුදල් ප්‍රතිපාදන යොමු කෙරෙනු ඇත.
   - ආධාරලාභියාගේ ස්වයං රැකියාව කරගෙන යාම පිළිබඳව සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරී/ සංවර්ධන නිලධාරී (සමාජ සේවා)ගේ නිරන්තර අධීක්ෂණය යොමු විය යුතුය. ව්‍යාපෘතියේ ප්‍රගතිය මත දෙවැනි වාරිකය ගෙවීම තීරණය කෙරේ.
   - සතුටුදායක ලෙස කර්මාන්තය දියුණු කරගත් ආධාරලාභියා වෙත දෙවැනි වාරිකය ගෙවීම සඳහා සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරී/ සංවර්ධන නිලධාරී (සමාජ සේවා) විසින් තම නිර්දේශය සහිත වාර්තාව ප්‍රාදේශීය ලේකම් වෙත භාර දෙනු ඇත.
   - ප්‍රාදේශීය ලේකම් අනුමැතිය මත දෙවන වාරිකය නිදහස් කළ පසු ඒ පිළිබඳ සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරී/ සංවර්ධන නිලධාරී (සමාජ සේවා) නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු අතර, ආධාරලාභියාට මුළු ආධාර මුදල ලබා දී මාස තුනකට පසුව අදාල මහජනාධාර දීමනාව අත්හිටුවීමට කටයුතු කළ යුතුය.
   - ආධාරලාභියා සාර්ථකව ව්‍යාපාරය පවත්වා නොගත හොත් ඔහුට කලින් හිමිව තිබූ මහජනාධාරය ද ව්‍යාපෘතිය සඳහා දෙවැනි වාරිකය ද අහිමි වනු ඇත.
   - මෙම වැඩසටහන යටතේ දිගින් දිගටම ආධාර ලබා නොදෙන අතර ආධාර ලබා දිය හැක්කේ එක් වරක් පමණි.
   - එබැවින් ලිපි ලේඛන නිවැරදිව පවත්වාගෙන යාමෙන් ආධාර දීම ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට විෂය භාර නිලධාරීන් හා සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරී/ සංවර්ධන නිලධාරී (සමාජ සේවා) න් වග බලාගත යුතු වේ.
   - නව නිලධාරීන්ගේ පැමිණීම සමඟ නැවත නැවත ආධාර ඉල්ලීමේ ප්‍රවණතාවය වැඩි හෙයින් නිලධාරීන්ගේ විශේෂ අවධානය මේ පිළිබඳව යොමු කළ යුතුය.

04. උතුරු මැද පළාත් සභාවේ 2015/08 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 2015/36 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අජන්ත ගුණවර්ධන,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.

අජන්ත ගුණවර්ධන
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත